# 4. දෙව් පියාගේ ආදරය

නිමල්ගේ හොඳ ම යාළුවා අමිල. දෙන්නා ම වෙනදා වගේ ම එදත් අඹගස් සෙවණට ගියා. ඒ ගියේ යාළුවොත් එක්ක කතන්දර කියන්න. සමන්මලීත්, රාධාත් අඹ ගහ යට ඉඳගෙන අඹ කන හැටි මේ දෙන්නා ඈත තියා ම දැක්කා. අරුල් හිටියේ අඹ ගහ උඩ. සියලු දෙනා ම එකතු වී අඹ කෑවා. ඊට පසු වෙනදා වගේ කතන්දර කියන්න පටන් ගත්තා.

“අද මුලින්ම කතන්දරය කියන්නේ මමයි” අමිල කීවා. “හොඳයි, හොඳයි, ඊළඟට මම” සමන්මලී කීවා. අමිල කතන්දරය කියන්න පටන් ගත්තා.





3. රජ.මු.නී.ස. - 190075

ගුරුතුමා කියා දුන් පාඩමේ ආදම් සහ ඒව ඔයාලට මතක ද? "ආ.... අර ලස්සන උයනක හිටියේ" අමිල ඇහුවා. "ඔව්, ඔව්, අපිට මතකයි." හැමෝ ම කිවුවා.

ඒ දෙන්න උයනේ හිටියෙ හරි ම සතුටින්. උයන පුරා ම ලස්සන මල් පිපිලා. රස රස පලතුරු පිරිලා. ලස්සන කුරුල්ලෝ හැමදා ම උදේට සින්දු කියනවා. දෙවිපියා ඒ දෙන්නට උයන බාර දීලයි තිබුණේ. මෙම උයනේ නම "ඒදන්".

උයන බාර දෙන කොට දෙවි පියා මෙහෙම කීවා. "ආදම් ඔබ ඒවත් සමඟ මේ උයනේ සතුටින් ඉන්න. සතුන් සහ ගස්වැල් හොඳට බලා ගන්න. ඔබලාට මම හුඟක් ආදරෙයි"

ටික දවසක් ගෙවී ගියා දෙවි පියා කී දේවල් ආදම් සහ ඒවට අමතක වුණා. මේ දෙදෙනා දෙවි පියාට අකීකරු වුණා. ඒත් දෙවි පියා මේ දෙන්නා සමග තරහ වුණේ නැහැ. දෙන්නාට ම අවවාද කළා. සමාවත් දුන්නා. දෙවි පියා මේ දෙන්නාට හරි ම ආදරෙයි.

**"දෙවි පියා අපිටත් ආදරෙයි" නිමල් කිවුවා.**
**"අපිත් දෙවි පියාට නිතර ආදරේ කරමු. කීකරු වෙමු." කියා සමන්මලී කිවුවා.**

## පැවරුම

1. ජේසුතුමාගේ පින්තූරයක් සොයා ගන්න. ඔබගේ සටහන් පොතේ එය අලවා ඊට පහළින් 'ජේසුනි, මම හොඳ කීකරු ළමයෙක් වෙමි' කියා ලියන්න.
2. දෙවි පියා ආදම් සහ ඒව අකීකරු වූ විට කළේ කුමක් ද? නිවැරදි පිළිතුර තෝරා ඔබගේ සටහන් පොතේ ලියා ගන්න.
   1. ආදම් සහ ඒව සමඟ තරහ වුණා.
   2. ආදම් සහ ඒවට දඬුවම් කළා.
   3. ආදම් සහ ඒවට අවවාද කර සමාව දුන්නා.